JMC vLearning
"your virtual learning partner"

# මූල්‍ය ප්‍රකාශන මත මතයක් ප්‍රකාශ කිරීම හා වාර්තාකරණය (SLAuS 700)

## AAT අදියර III

FCA - මූල්‍ය පාලනයන් හා විගණනය


ජීවන්ත පෙරේරා
B.Sc. (Accountancy) Sp., ACA, Reading for MBA (Cardiff Metropolitan-UK)



JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය
JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

JMC Jayasekera Management Centre (Pvt) Ltd
Pioneers in Professional Education
65/2A, Chittampalam Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917

# මූල්‍ය ප්‍රකාශන මත මතයක් ප්‍රකාශ කිරීම හා වාර්තාකරණය
**(S.L.Au.S -700)**

විගණන වාර්තාවක අඩංගු කරුණු

විගණන වාර්තාවක ස්වරූපයන්

JMC vLearning
"your virtual learning partner"

## විගණන වාර්තාවක අඩංගු කරුණු

A) මාතෘකාව → ස්වාධීන විගණකගේ වාර්තාව

B) ආමන්ත්‍රණය / ඇමතුම ලබන්නා → අදාළ පාර්ශවයයන්ට නිසි ආකාරව ආමන්ත්‍රණය කළ යුතුය.

C) මතය දැක්වෙන ඡේදය
- විගණනය කරන මූල්‍ය වාර්තා කට්ටලය හඳුනාගත යුතු වේ
- විගණකවරයා අදාළ ව්‍යාපාරයේ මූල්‍ය වාර්තා පිළිබඳව අවසන් මතය ප්‍රකාශ කිරීම

D) මතය සඳහා පදනම දැක්වෙන ඡේදය
- විගණනය සිදු කළේ S.L.Au.S අනුකූලව බව සඳහන් කළ යුතු වේ.
- වෘත්තීය ආධර්මයන්ට අනුව සෑම වෘත්තීය ආචාරධර්මයන්ට අනුකූල බව විගණකවරයා ව්‍යාපාර සම්බන්ධයෙන් ස්වාධීන පාර්ශවයක් බවත් වෘත්තීය ආචාරධර්ම අවශ්‍යතාවයක්ම සම්පූර්ණ කරන ලද බව සඳහන් කළ යුතු වේ.
- ලබාගන්නා ලද ප්‍රමාණවත් හා යෝග්‍ය විගණන සාක්ෂි තමා පලකල මතය සඳහා සාධාරණ පදනමක් සපයන බව සඳහන් කළ යුතු වේ.

E) ප්‍රධාන විගණන ගැටලු ඇතුලත් ඡේදය

- විගණකගේ වෘත්තීමය විනිශ්චය අනුව මූල්‍ය වාර්තා විගණනයට අදාළ ඉතා වැදගත් කරුණු පිළිබදව සටහනක් තබයි. තවද එම ගැටලු පිළිබදව සලකා බලන ලද්දේ මූල්‍ය වාර්තා සමස්ථයක් ලෙස ගෙන බවත් හා එම ගැටලු පිළිබදව වෙනමම මතයක් පල නොකරන බවත් සදහන් කළ යුතුය.

F) වෙනත් තොරතුරු ඇතුලත් වන ඡේදය

- කළමනාකාරීත්වය වෙනත් තොරතුරු සඳහා වගකීම දරණ බව
- මූල්‍ය වාර්තා පිළිබඳව විගණකගේ මතය හරහා වෙනත් තොරතුරු ආවරණය නොවන බව.
- විගණකගේ වගකීම වන්නේ, වෙනත් තොරතුරු කියවා බලා, මූල්‍ය වාර්තා සමග ප්‍රමාණාත්මක අසංගතතාවයක් තිබේද යන්න සලකා බැලීම බව.

G) මූල්‍ය වාර්තා සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ යහපාලනය සම්බන්ධයෙන් වගකීම දරණ පාර්ශවයන්ගේ වගකීම

- ශ්‍රි. ල.ගි. ප්‍ර. වලට අනුව සත්‍ය හා සාධාරණ දර්ශනයක් ගෙන හැර දක්වෙන ආකාරයට මූල්‍ය වාර්තා පිළියෙල කිරීමේ වගකීම කළමනාකාරීත්වය සතු වේ.
- එහිදී මූල්‍ය වාර්තා පිළියෙල කිරීමේදී, ව්‍යාපාරයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳව සලකා බැලීමේ වගකීම කළමනාකාරීත්වය සතු බව.
- යහපාලනය පිළිබඳව වගකීම දරන පාර්ශවයන් මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පිළිබඳව සලකා බැලිය යුතු බව.

H) මූල්‍ය වාර්තා විගණනය සම්බන්ධයෙන් විගණකවරයාගේ වගකීම

- මූල්‍ය වාර්තා සමස්ථයක් ලෙස ගත් කළ, ප්‍රමාණාත්මක සාවද්‍යතාවයන්ගෙන් තොර වේද යන්න පිළිබඳව සාධාරණ ආරක්ෂණයක් ලබා දීම විගණකගේ අරමුණ වන බව.
- විගණනය ශ්‍රී. ල. වි. ප්‍ර. වලට අනුව සිදු කල බවත්, එහිදී වෘත්තීමය විනිශ්චය හා වෘත්තීමය විමර්ශනතාවය පවත්වා ගත් බව.
  - මූල්‍යවාර්තා තුල ප්‍රමාණාත්මක සාවද්‍ය ඇති වීමේ අවධානම හඳුනා ගැනීම සහ තක්සේරු කිරීම සිදු කළ බව.
  - වඩාත් උචිත යෝග්‍ය ආකාරයට, විගණක ක්‍රියාපටිපාටි නිර්මාණය කිරීමේදී අභ්‍යන්තර පාලනයන් පිළිබඳව සලකා බැලීම.
  - කළමනාකාරීත්වය භාවිතා කරන ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල යෝග්‍යතාවය තක්සේරු කල බව.
  - ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම්ව ව්‍යාපාරයට අඛණ්ඩව ව්‍යාපාර කටයුතු කරගෙන යාමට ඇති හැකියාව පිළිබඳව ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සලකා බැලීම හා කළමනාකාරීත්වය භාවිතා කරන ලද අඛණ්ඩ පැවැත්ම උපකල්පනයේ යෝග්‍යතාවය නිගමනය කිරීම.
  - මූල්‍ය වාර්තාවල සමස්ථ ඉදිරිපත් කිරීම පරීක්ෂා කිරීම

H) මූල්‍ය වාර්තා විගණනය සම්බන්ධයෙන් විගණකවරයාගේ වගකීම

- අභ්‍යන්තර පාලනයන්වල හඳුනා ගන්නා ලද වැදගත් දුර්වලතා ඇතුලත් වන, විගණකගේ වැදගත් සොයා ගැනීම්, සැළසුම්කරන ලද විෂය පථය සහ අනිකුත් ගැටළු කළමනාකාරීත්වයට සංනිවේදනය කළ බව.
- විගණනය තුලදී වෘත්තීමය ආචාරධර්මයන්ට, අනුකූලව කටයුතු කල බවත්, සියළුම වෘත්තීමය අවශ්‍යතාවයන්ට අනුකූල වූ බවත් ඒ බව තහවුරු කරමින්, වාර්තාවක් ලබා දුන් බව.
- යහපාලනය පිළිබඳව වගකීම දරන පාර්ශවයන් සමඟ සාකාච්ඡා කරන ලද කරුණු වලින්, ඉතා වැදගත්, ප්‍රධාන විගණන ගැටළු, විගණන වාර්තාව තුල විස්තර කරන ලද බව.

I) බලපාන නීතිරීති සහ වෙනත් ව්‍යවස්ථාපිත අවශ්‍යතා.

J) අත්සන

K) ලිපිනය

L) දිනය

JMC vLearning
"your virtual learning partner"

